දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**


මගේ අංකය / எனது இல. / My No. PSC/EST/8/1/44/1/8/2013

ඔබේ අංකය / உமது இல. / Your No. 2/1/17/2/13

දිනය / திகதி / Date 2013.12.24

27 DEC 2013

ලේකම්,

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටි සඳහා අනුමැතිය ලබා ගැනීම. - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විධායක සේවා ගණයේ ඉංජිනේරු (යාන්ත්‍රික) තනතුර (SL-01) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය</u>**

උක්ත කරුණ සම්බන්ධ ඔබේ සමාංක හා 2013.12.12 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමග එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවාගැනීම් පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

එම්.ඩී.ජේ. ප්‍රසාද්
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත -

01.ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමග එවමි)

02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් (මුල් පිටපත මේ සමග එවමි)

03. අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (මුල් පිටපත මේ සමග එවමි)

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි
## විධායක සේවා ගණයේ ඉංජිනේරු ( යාන්ත්‍රික ) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

01. **සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව — යොමු අංකය : DTET/04/AO/SOR/Gen දිනය : 2013.05.20

1.2 අමාත්‍යාංශය : යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය — යොමු අංකය : 2/1/17/2/13 දිනය : 2013.06.18

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම — යොමු අංකය : DMS/C/05/46 දිනය : 2012.08.27

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය — යොමු අංකය : EST-2/RECRU/03/2052 දිනය : 2013.05.14

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය : NSCC/1/44/1/SR දිනය : 2012.12.24

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය — යොමු අංකය : PSC/EST/8/1/44/1/8/2013 දිනය : 2013.11.~~22~~ 21

02. **පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

03. **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : විධායක

3.2 ශ්‍රේණි : III, II සහ I

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනයන්හි කාර්යයන් පවත්වාගෙන යාමේදී අවශ්‍යවන කළමනාකරණ තීරණ ගැනීම් හා සම්බන්ධ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.